# කෘෂිකර්ම අමාත්‍යාංශය
# கமத்தொழில் அமைச்சு
# Ministry of Agriculture

80/5, "ගොවිජන මන්දිරය", රජමල්වත්ත පටුමග, බත්තරමුල්ල.
80/5, "கொவிஜன மந்திரய", ரஜமல்வத்தை வீதி, பத்தரமுல்லை.
80/5, "Govijana Mandiraya", Rajamalwatte Avenue, Battaramulla, Sri Lanka.
කාර්යාලය அலுவலகம் Office – 2869553, 2888902, 2872097. ෆැක්ස් தொலைநகல் Fax – 2868910


| | | | |
|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My No. | 7/1/3/2/2016/අ.වැ.යෝ/පොදු | ඔබේ අංකය<br>உமது இல.<br>Your No. | |
| දිනය<br>திகதி<br>Date | 2017.01.05 | | |

ගොවිජන සංවර්ධන නියෝජ්‍ය/ සහකාර කොමසාරිස්

**<u>2016/17 මහ කන්නයේ සහනාධාර මුදල් ගිණුම්ගත කිරීම ප්‍රතික්ෂේප වූ වී ගොවීන්ගේ තොරතුරු නිවැරදි කිරීම</u>**

2016/17 මහ කන්නයේ සහනාධාර මුදල් **ගිණුම්ගත කිරීම** ප්‍රතික්ෂේප වූ වී ගොවීන්ගේ ලැයිස්තු බැංකු විසින් අප වෙත එවා ඇති අතර එම බැංකු ගිණුම් වලට මුදල් බැර නොවීමට පහත සඳහන් හේතු බලපා ඇති බව එහි සඳහන් කර ඇත. (දැනටමත් එම ප්‍රතික්ෂේපිත ලැයිස්තු විද්‍යුත් තැපැල මඟින් ඔබ වෙත යොමු කර ඇත.)

1) ධනයෝජන ගිණුම් අංක ලබා දීම.
2) වසා දමන ලද ගිණුම් පැවතීම.
3) ගිණුම් අංකය නිවැරදි නොවීම (FCG 02 ආකෘති පත්‍රයට බැංකු ශාඛා අංක හා ගිණුම් අංක ඇතුළත් කිරීම යටතේ 7/1/3/2 අ.වැ.යෝ (පොදු) හා 2016.10.17 දිනැති ලිපිය බලන්න.)
4) බැංකු ශාඛා අංකය නිවැරදි නොවීම

ඒ අනුව ප්‍රතික්ෂේපිත ලැයිස්තු කඩිනමින් නිවැරදි කර ඉදිරිපත් කළ යුතු බැවින් ගොවිජන සංවර්ධන නිලධාරින් දැනුවත් කර පහත ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරන ලෙස කාරුණිකව දන්වා සිටිමි.

1 බැංකු මඟින් ප්‍රතික්ෂේපිත ගොවීන් සඳහා <u>අදාළ බැංකුවේ ගොවි දිරිය නව ගිණුමක් විවෘත කර</u> තොරතුරු ඉදිරිපත් කරන ලෙස ගොවි මහතුන් වෙත උපදෙස් ලබා දී සතියක් ඇතුළත එම කටයුතු ඉටු කරවා ගෙන බැංකු ශාඛාව, බැංකු ශාඛා අංකය (Branch Code) හා නව ගිණුම් අංකය ඇතුළත් කර සංශෝධිත FCG (2 P) පිළියෙළ කරන්න. මෙහිදී බැංකු ගිණුම විවෘත කල යුත්තේ මුල් අවස්ථාවේදී තොරතුරු ඉදිරිපත් කල බැංකුවට අදාළ ශාඛාවකින් බව තරයේ උපදෙස් ලබා දෙන්න. තොරුතුරු නිවැරදි කිරීමේ දී එසේ ක්‍රියා කර ඇති බවට තහවුරු කර ගන්න. (මූලික ගාස්තුවකින් තොරව ගොවි දිරිය ගිණුම් විවෘත කිරීමටත් එම ගිණුම් වලින් ගොවි ණය කපා නොහැරීමටත් අදාළ බැංකු මේ වන විටත් එකඟ වී තිබේ.)

2 ප්‍රතික්ෂේපිත ලැයිස්තු නිවැරදි කිරීමේ දී අදාළ බැංකුවෙන් ( ලංකා බැංකුව/ මහජන බැංකුව/ ප්‍රාදේශීය සංවර්ධන බැංකුව/ ජාතික ඉතිරි කිරීමේ බැංකුව) ප්‍රතික්ෂේපිත ලැයිස්තුවට අදාළ ප්‍රතිලාභීන් පමණක් ඇතුලත් විය යුතු අතර අතිරේක, පරිභාහිර හෝ වෙනත් කිසිදු නමක් ඇතුළත් නොවීමට වග බලා ගත යුතුය. එසේ වැරදි තොරතුරු ඇතුළත් කිරීමෙන් දිස්ත්‍රික්කයේ සම්පූර්ණ ලැයිස්තුවම ප්‍රතික්ෂේප විය හැකි බව ද අවධාරණය කරමි.


ලේකම් / செயலாளர்
දුරකථන / தொலைபேசி / Telephone - 011-2868920
ඊ - මේල් / ஈமெயில் / E- mail - sec.agri@yahoo.com

3 ප්‍රතික්ෂේපිත ලැයිස්තු සංශෝධනයේදී ඒ ඒ ගොවියාට අදාළ **බැංකු ගිණුම් අංකය, බැංකු ශාඛාව හා බැංකු ශාඛා අංකය හැර** FCG (2 P) හි කිසිදු තොරතුරක් මුල් ලේඛණවලට පටහැනි වන සේ වෙනස් නොකල යුතුය. (DY/Asst Comm. Serial No./ DO'S Serial No:/ GN Division/ Famer's Name/ Farmer's NIC No./ Farmers Address / Payable Subsidy (Rs.)/ Land Extent (ha)/ Farmer's Telephone No.)

ඉහත සංශෝධිත FCG (2 P) වාර්තාවට අනුව FCG 3, 4, 5, 6 සාරාංශ ලේඛනද සකස්කල යුතු අතර පෙර සේම අපගේ වෙබ් අඩවියට Upload කල යුතුවේ. එහි DVD පිටපත් හා දෘඩ පිටපත් දිස්ත්‍රික් මට්ටමේ අත්සන් සහිතව ( අතිරේක දිස්ත්‍රික් ලේකම්, ගොවිජන සංවර්ධන නියෝජ්‍ය/ සහකාර කොමසාරිස් හා දිස්ත්‍රික් භාර පොහොර සහකාර අධ්‍යක්ෂ) සහතික කර 2017.01.22 පෙර අප වෙත ගෙනවිත් පෞද්ගලිකව භාර දීමට කටයුතු කරන මෙන් කාරුණිකව ඉල්ලමි.

ඉහත කරුණු වලට පටහැනිව වෙනස්කම් සහිතව එවන ලද දත්ත පරිගණක ජාල පද්ධතිය තුළ ස්වයංක්‍රීයව සංසන්දනය වන බැවින් ප්‍රතික්ෂේප වීමට ඉඩ ඇති බව වැඩිදුරටත් දන්වා සිටිමි. තවද 2016/17 මහ කන්නයේ සහනාධාර ලැබීමට සුදුසුකම්ලත් සියළු ලියාපදිංචි ගොවීන්ගේ ලැයිස්තු චක්‍රලේඛනයේ සඳහන් පරිදි අදාළ කාර්යාලවල ප්‍රසිද්ධ කිරීමට කටයුතු කළ යුතු බව නැවතත් අවධාරණය කරමි. මේ පිළිබඳව ඔබගෙන් ලැබෙන කඩිනම් සහාය අතිශයින්ම අගය කරමි.

එන්.පී.ඩී.සී. පියතිලක
අතිරේක ලේකම් (මෙහෙයුම් හා ඇගයුම්)
අධ්‍යක්ෂ
ජාතික පොහොර ලේකම් කාර්යාලය

පිටපත්-

1. ලේකම්, කෘෂිකර්ම අමාත්‍යාංශය - කාරුණික දැන ගැනීම සඳහා
2. ලේකම් , මුදල් අමාත්‍යාංශය - එම
3. රාජ්‍ය ලේකම්, කෘෂිකර්ම අමාත්‍යාංශය - එම
4. අධ්‍යක්ෂ ජනරාල්, සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව - එම
5. සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන් - එම
6. ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල් - එම
7. ප්‍රධාන ගණකාධිකාරී, කෘෂිකර්ම අමාත්‍යාංශය - එම
8. සාමාන්‍යාධිකාරී - එම
   (ලංකා බැංකුව, මහජන බැංකුව, ප්‍රාදේශීය සංවර්ධන බැංකුව, ජාතික ඉතිරි කිරීමේ බැංකුව)
9. ආචාර්ය හර්ෂ විජේවර්ධන මහනුවර, කොළඹ විශ්ව විද්‍යාලය - මෙම ලිපිය වෙබ් අඩවියට ඇතුළත් කිරීම හා එම තොරතුරු දත්ත පද්ධතියට ඇතුළත් කිරීම සඳහා
10. දිස්ත්‍රික් සහකාර අධ්‍යක්ෂ, ජාතික පොහොර ලේකම් කාර්යාලය - අවශ්‍ය කටයුතු සඳහා
11. සියලුම ගොවිජන සංවර්ධන නිලධාරීන් - එම

කෘෂිකර්ම අමාත්‍යාංශය
கமத்தொழில் அமைச்சு
# Ministry of Agriculture
ජාතික පොහොර ලේකම් කාර්යාලය
# தேசிய உரச் செயலகம்
# National Fertilizer Secretariat

මගේ අංකය / எனது இல. / My No. 7/1/3/2 අ.වැ.යෝ.පොදු    ඔබේ අංකය / உமது இல. / Your No.    දිනය / திகதி / Date 2016.10.17

**සියළුම ගොවිජන සංවර්ධන නිලධාරීන් ,**

**FCG - 02 ආකෘති පත්‍රය සඳහා බැංකු ශාඛා අංක හා ගිණුම් අංක ඇතුලත් කිරීම.**

- **මහජන බැංකුවේ ශාඛා අංක හා ගිණුම් අංක FCG - 02 ආකෘතියට ඇතුළත් කිරීම.**

FCG - 02 ආකෘති පත්‍ර වල මහජන බැංකුවේ ශාඛා අංක හා ගිණුම් අංක (Branch code) ඇතුලත් කිරීමේදී පහත සඳහන් කරුණු කෙරෙහි විශේෂ අවධානය යොමු කර අදාළ දත්ත FCG - 02 ලේඛන වලට ඇතුළත් කරන ලෙස කරුණාවෙන් දන්වමි.

1. ගිණුම් හිමි ගොවීන්ගේ බැංකු පාස් පොතේ ගිණුම් අංකය සඳහන් කොටසේ අංක 15කින් යුතු ගිණුම් අංකයක් අනිවාර්යයෙන්ම තිබිය යුතුය.
2. අංක 15 ට අඩු ගිණුම් අංක සඳහන් ගිණුම් පොහොර සහනාධාර මුදල් බැර කිරීම සඳහා යොදා නොගත යුතුය.
3. ගිණුම් අංකයේ පළමු අංක 3 බැංකු ශාඛා අංකය (Branch code) ලෙසද ඉතිරි අංක 12 ගිණුම් අංකය ලෙසද FCG - 02 ආකෘතියේ අදාළ කොටු තුළ දැක්විය යුතුය.

| | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 2 | 0 | 1 | 2 | 0 | 0 | 1 | 7 | 8 | 9 | 1 | 2 | 3 | 4 | 5 |
| ↓ | ↓ | ↓ | | | | | | | | | | | | |
| 2 | 0 | 1 | 2 | 0 | 0 | 1 | 7 | 8 | 9 | 1 | 2 | 3 | 4 | 5 |
| Branch Code | | | Account Number | | | | | | | | | | | |

4. ඉතිරි අංක 12 හි පළමු අංකය 2, 10 හෝ 20 විය යුතුය.

17/10/2016
L. U. L. Alwis
Chief Manager (Grade I)
Service No. 12313-3
Centralized Back Office
Head Office, People's Bank

---

- **ලංකා බැංකුවේ ශාඛා අංක හා ගිණුම් අංක FCG - 02 ආකෘතියට ඇතුළත් කිරීම.**

1. ලංකා බැංකුවේ පාස් පොතේ උපරිම අංක 08 කින් යුතු ගිණුම් අංකයක් සඳහන් වේ. එම අංක පිළිවෙලින් නිවැරදි ලෙස FCG - 02 ආකෘතියේ ගිණුම් අංකයට අදාළ තීරුවට ඇතුළත් කළ යුතුය.
2. ලංකා බැංකු ශාඛා අංකය ලෙස සඳහන් කළ යුත්තේ ගිණුම් හිමියා තම ගිණුම පවත්වා ගෙන යනු ලබන බැංකු ශාඛාවේ ශාඛා අංකය වේ.
3. එම අංකය ඔබ වෙත සපයා ඇති ලේඛනය ඇසුරෙන් හා අදාළ බැංකු ශාඛාව විමසීමෙන් ලබාගෙන නිවැරදිව ඇතුළත් කළ යුතුය.

BANK OF CEYLON


දුරකථන / தொலைபேசி / Telephone 011-2885402, 011-2887409, 011-2887449
80/5, "ගොවිජන මන්දිරය", රජමල්වත්ත පටුමග, බත්තරමුල්ල.
80/5, "கொவிஜன மந்திரய", ரஜமல்வத்தை வீதி, பத்தரமுல்லை.
80/5, "Govijana Mandiraya", Rajamalwatte Avenue, Battaramulla, Sri Lanka
ඊ - මේල් / மின்னஞ்சல் / E- mail nfsrilanka@yahoo.com
ෆැක්ස් / தொலைநகல் / Fax

- ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ ශාඛා අංක හා ගිණුම් අංක FCG - 02 ආකෘතියට ඇතුළත් කිරීම.

1. ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ පාස් පොතේ උපරිම අංක 15 කින් යුතු ගිණුම් අංකයක් සඳහන් වේ. එම අංක සිල්ලම නිවැරදි ලෙස FCG - 02 ආකෘතියේ ගිණුම් අංකයට අදාළ තීරුවට ඇතුළත් කළ යුතුය.
2. ජාතික ඉතිරි කිරීමේ බැංකු ශාඛා අංකය ලෙස සඳහන් කළ යුත්තේ ගිණුම් හිමියා තම ගිණුම පවත්වා ගෙන යනු ලබන බැංකු ශාඛාවේ ශාඛා අංකය වේ.
3. එම අංකය ඔබ වෙත සපයා ඇති ලේඛනය ඇසුරෙන් හා අදාළ බැංකු ශාඛාව විමසීමෙන් ලබාගෙන නිවැරදිව ඇතුළත් කළ යුතුය.

---

- ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ ශාඛා අංක හා ගිණුම් අංක FCG - 02 ආකෘතියට ඇතුළත් කිරීම.

1. ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ පාස් පොතේ උපරිම අංක 12 කින් යුතු ගිණුම් අංකයක් සඳහන් වේ. එම අංක සිල්ලම නිවැරදි ලෙස FCG - 02 ආකෘතියේ ගිණුම් අංකයට අදාළ තීරුවට ඇතුළත් කළ යුතුය.
2. ප්‍රාදේශීය සංවර්ධන බැංකු ශාඛා අංකය ලෙස සඳහන් කළ යුත්තේ ගිණුම් හිමියා තම ගිණුම පවත්වා ගෙන යනු ලබන බැංකු ශාඛාවේ ශාඛා අංකය වේ.
3. එම අංකය ඔබ වෙත සපයා ඇති ලේඛනය ඇසුරෙන් හා අදාළ බැංකු ශාඛාව විමසීමෙන් ලබාගෙන නිවැරදිව ඇතුළත් කළ යුතුය.
4. පාස්පොතේ ගිණුම් අංකය අංක 12 ට අඩු අවස්ථාවේදී, ගිණුම් හිමියා අදාල ශාඛාවෙන් අංක 12 ක් යුතු ගිණුම් අංකය ලබාගෙන FCG - 02 ආකෘතියට ඇතුලත් කල යුතුය.

Regional Development Bank
Head Office
Colombo

---

මෙම උපදෙස් FCG - 02 P හා FCG - 02 H ආකෘති වලට දත්ත ඇතුළත් කිරීමේදී අදාළ නිලධාරින් විසින් අනිවාර්යයෙන් පිළපැදිය යුතු බව සියළු කාරුණිකව දන්වා සිටිමි.

පොහොර සහනාධාර මුදල් ප්‍රදාන වැඩසටහන - (2016/17 මහ කන්නය) සඳහා ඔබට අවශ්‍ය බැංකු ශාඛා අංක , චක්‍රලේඛ හා අවශ්‍ය උපදෙස් www.aginfo.lk වෙබ් අඩවිය වෙත පිවිසීමෙන් ලබා ගත හැකි වේ.

එන්.පී.ඒ.සී.පියතිලක
අතිරේක ලේකම් (ඇගයුම් හා මෙහෙයුම්)
අධ්‍යක්ෂ
ජාතික පොහොර ලේකම් කාර්යාලය

පිටපත් :- ගොවිජන සංවර්ධන කොමසාරිස්
සියළුම ගොවිජන සංවර්ධන සහකාර / නියෝජ්‍ය කොමසාරිස්වරුන්
සියළුම සහකාර අධ්‍යක්ෂකවරුන් (ජාතික පොහොර ලේකම් කාර්යාලය)